1

සුබස් සිතිවලි

වී ක ධර්මබන්ධු

2

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

"සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන

"සාහිත්‍ය සම්භාෂණ" එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන් සෑම මසකම

අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් ඇසීමට http://www.sbs.com.au/yourlanguage/sinhalese/

දේව උදහස.... බලා ගෙන.....

වී.ක. ධර්මබන්ධු



දෙවියන්
සර්ව බලදරු බව
දන්නා අපි
හොඳටත් නරකටත්
උන්ගේ රැකවරන
පිහිට පතන්නෙමු

පව්න් හා දොසින් තොර
නර පනුවන්
යෙහෙන් වෙසෙනු දැක්ම
දෙවියන් ගේ කැමැත්තයි.

දෙව් බැල්ම ලබන්නන්
පව් වැඩ - වැරදි වැඩ
කිරීමෙන් වැලකී
සිටින්නේ එ නිසා ය

එය සිඳ බිඳ දමන
දුසිරිතේ හැසිරෙන
පව්වු නර පනුවන්ට
දෙවියන් දඬුවම් කරන්නේ
නොකර බැරි නිසා මිස
හිතකින් නම් නො වේ.

මහ ගිනි අව්ලුවා
නා කපන වැසි වස්සා
රට ගම් දනව් වනසා
පව්වු නර පනුවන්ට
දඬුවම් කල සැටි ඔව්න්
බන පොතේ සඳහන් වේ.
සතා සීපාවාට ද
එවිට ගැලවීමක් නැත.

ජපානයට එදා
පරමානු බොමු හෙලැවීමත්
විසුවියස් වල්කැනුව
පුපුරුවා හැරුමත්
යුද ගිනි අව්ලුවා
දෙවරක්ම ලක් කෙල ගනන්
මිනිස් බිලි ගෙන
ලොව ම අමු සොහෙනක්
කිරීමට දිරි දීමත්
දෙවියන්ගේ
කැමැත්තට සිදු වී ඇත.

අදත් දෙවියෝ
එබඳු වැඩ කරන බව
ඉස් - පලස්තීන ගැටුම්
සිරි - ඉරාකී අවුල්
ඉබෝලා වසංගතය
සෝමාලි ඈ රටවල
දුර්විත්ස-වසංගත
ඇති කිරීමෙන් පෙනේ.

වැරදි වැඩ කල-කරන
පව්වු නර පනුවන්ට
දඬුවම් කරන විට දෙවියන්
උන්ගේ වැඩට අවහිර
කිරීමේ බර පතලකම
තේරුම් ගත යුතුය.

කව්රු කව්රුත් අප
එසේ නොවුව හොත්
දෙවියන්ගේ උදහසට
අපි ද ලක් විය හැකිය.

(නා කපන - නහකපන - කපනහනවැස්ස, වල්කැනුව - ගිනි කන්ද (වෝල්කේනෝ)